## අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

# අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය

**2023 අංක 10 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත බලාත්මක කිරීම සඳහා පිහිටුවන ලද අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ පවතින පහත සඳහන් කාර්ය මණ්ඩල පුරප්පාඩු සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ පටිපාටියට අනුව සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

## 01. භාෂා පරිවර්තක (ඉංග්‍රිසි/සිංහල) MA 4

**සුදුසුකම් හා පළපුරුද්ද :**

**බාහිර අයදුම්කරුවන්:**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ඉංග්‍රිසි විෂයක් ලෙස ඇතුලත්ව උපාධියක් ලබා තිබීම.

සමඟ

අධ්‍යාපන පොදු සහතිකපත්‍ර (සාමාන්‍යපෙළ) විභාගයේදි සිංහල විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව සමත්ව තිබීම

සමඟ

ඉංග්‍රිසි භාෂාවෙන් සිංහල භාෂාවට හා සිංහල භාෂාවෙන් ඉංග්‍රිසි භාෂාවට පරිවර්තනය කිරීමේ අවම වශයෙන් වසර එක (01)ක පළපුරුද්දක් ලබා තිබීම.

**වැටුප් පරිමාණය :**

MA 4: රු.37,970-10x755-15x930-5x1135-65,145

**වයස් සීමාව :**

අවු:22ට නොඅඩු හා අවු:45ට නොවැඩි විය යුතුය.

## 02. තොරතුරු නිලධාරී MA 4

**සුදුසුකම් හා පළපුරුද්ද :**

**බාහිර අයදුම්කරුවන්:**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තොරතුරු තාක්ෂණය විෂයක් ලෙස ඇතුලත්ව උපාධියක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්:**

1. මෙම තනතුර සඳහා වන ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන (MA 01) සේවා ගණයෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර අට (08)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

**වැටුප් පරිමාණය :**

MA 4 : රු.37,970-10x755-15x930-5x1135-65,145

**වයස් සීමාව :**

අවු:22ට නොඅඩු හා අවු:45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි

## 03. කළමනාකරණ සහකාර MA 1-1 (තනතුරු 02)

**සුදුසුකම් හා පළපුරුද්ද :**

**බාහිර අයදුම්කරුවන්:**

(අ). අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී

I. සිංහල / දෙමළ
II. ගණිතය
III. ඉංග්‍රීසි භාෂාව

යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.

(ආ). අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්:**

(අ) ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය සහ ශිල්පීය සේවා ගණයන් හි පහත “ආ” , “ඇ” සහ “ඉ” සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා අයදුම් කළ හැක.

(ආ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී

I. සිංහල / දෙමළ
II. ගණිතය
III. ඉංග්‍රීසි භාෂාව

යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම,

**හා**

පරිගණක වදන් සැකසුම / යතුරු ලියනය පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවක් හදාරා තිබීම.

(ඇ) සේවයෙහි ස්ථිර පත්වීම් දැරිය යුතු අතර එම පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

(ඉ) නියමිත දිනට පූර්වාසන්නව ස්ථිරපත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

**වැටුප් පරිමාණය :**

MA 1-1 - රු. 27,910-10x300-7x350-4x495-20x660- රු.48,540

**වයස් සීමාව :**

අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**කොන්දේසි :**

01. **ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය**

පත්වීම් බලධාරියා විසින් නියම කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. සුදුසුකම් ලැබූවන් අතුරින් අවම වශයෙන් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වන සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ඇත. ඉහළම ලකුණු ලැබූවන් අතරින් කුසලතා අනුපිළිවෙළ අනුව තෝරා ගැනීම් සිදු කෙරේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දීම පහත පරිදි වේ:-

| | | |
|---|---|---|
| අදාළ පළපුරුද්ද | - | ලකුණු 30 |
| අදාළ අතිරේක අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් | - | ලකුණු 30 |
| අනෙකුත් අදාළ කාර්යය සාධනයන් හා කුසලතා | - | ලකුණු 15 |
| සම්මුඛ පරීක්ෂණයේ දී කාර්ය සාධනය | - | ලකුණු 25 |
| **මුළු ලකුණු ගණන** | - | **ලකුණු 100** |

02. සෑම ඉල්ලුම්කරුවෙක්ම

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන් ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
III. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

03. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම් කළ යුතු අතර ඔහු හෝ ඇය තනතුර සඳහා තෝරා ගතහොත් නිදහස් කරන බවට ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සහිතව අයදුම්පත ඉදිරිපත් කළ යුතුය.

04. දැන්වීමට අනුව මූලික සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

05. ඉහත සුදුසුකම් හා තනතුරට අදාළ පළපුරුද්ද සනාථ කෙරෙන සහතික පත්වල සහතික කරන ලද ඡායා පිටපත් අයදුම්පත සමඟ එවිය යුතුය.

06. අයදුම්කරුවන් විසින් අනිසි බලපෑම් කිරීම හෝ විමසීම් සිදු කිරීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් වනු ඇත.

07. අයදුම්පත් කැඳවීම අවසන් දිනට නොලැබෙන සියලු අයදුම්පත් සහ සහතික පත්වල සහතික කල පිටපත් නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ පිහිටුවා ඇති සේවක අර්ථසාධක අරමුදලට ඔබ දායක විය යුතු අතර ඔබගේ දායක මුදල වැටුපෙන් 08%ක් වන අතර ආයතනය ඔබගේ වැටුපෙන් 12% කට සමාන මුදලක් ප්‍රධානය කරයි.

09. සේවක භාරකාර අරමුදල සඳහා ආයතනයෙන් ඔබගේ වැටුපෙන් 3% කට සමාන මුදලක් ප්‍රධානය කරයි.

අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද හා සියලු තොරතුරු ඇතුළත් ජීව දත්ත සටහනක් ද සමඟ, **"අධ්‍යක්ෂ ජනරාල්, අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය, 428/11 ඒ, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල"** යන ලිපිනයට 2024.05.27 දින හෝ ඊට ප්‍රථම ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය,**
**428/11 ඒ, පළමු මහල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.**
**දු. අංක. 0112879539**
**දිනය 2024.05.09**